<u>කොළඹ දිසා අධිකරණයේදී ය.</u>

කොලඹ ලෝටස් පාරේ, අංක 55, කොළඹ හිල්ටන් ක්‍රීඩා සංකීර්ණය බාරේ, හොටේල් ඩෙවලසරස් (ලංකා) ලිමිටඩ් සමාගම පිලිබඳව වන කාරනය සම්බන්ධයෙන්,

සහ,

1982 අංක 18 දරන සමාගම් පනතේ IX කොටස යටතේ අධිකරණය විසින් ඈවර කිරීම සඳහා කරනු ලබන ඉල්ලීමක් පිලිබඳව වන කාරණය සම්බන්ධයෙන්,

නිහාල් ශ්‍රී අමරසේකර,
අංක 167/4, විපුලසේන මාවත,
කොලම 10.

පෙත්සම්කරු-

<u>කොළඹ අති /දිසා විනිසුරු සිසිර.කේ.රත්නායක මැතිතුමා ඉදිරිපිටදිය.</u>

<u>සටහන් ගැනීම -පී.ඒ.පතිරනගේ විසිනි.</u>

<u>2006.11.23</u>

<u>නඩු අංකය- 217 සී.ඕ.</u>

පැමිනිලිකාර සමාගම වෙනුවෙන් නීතිඥ ඩී.ඩබ්ලිව් කුලරත්න ඇසෝසියේට්ස්හි උපදෙස් පිට නීතිඥ දිල්රුක්ෂි බොතේජු මහත්මිය, ෂිවාන් කනගීෂ්වරන් මහතා,

එම්.ඒ.සුමන්දිරන් මහතා, ජනාධිපති නීතිඥ ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා සමග ජනාධිපති නීතිඥ කේ.කනගීශ්වරන් මහතා පෙනී සිටී.

මෙම පෙත්සම සමාගම් නීතියේ 255 (F) වගන්තිය යටතේ සාධාරණත්වය න්‍යාය යටතේ සමාගම ඈවර කිරීමට කරන ඉල්ලීමකි. සමාගම් නීතිය යටතේ පූර්වෝක්ත සත්‍ය සිද්ධි කාරනා කරන කොටගෙන සමාගම ඉදිරියට යාමට නොහැකිවන පදනම යටතේ මෙම ඉල්ලීම කරන බවට ගරු අධිකරණයට කියා සිටින අතර, (ඒ සම්බන්ධයෙන් සමාගම් නීතිය පිලිබඳ පාමස්ගේ පොතෙහි 1121 වැනි පිටුව පෙන්වා සිටියි.) මෙහි පෙත්සම්කරු මෙකී සමාගමේ කොටස්කරුවෙක් වන අතර, සමාගම් නීතිය 258 (2) වගන්තිය යටතේ මෙම ඉල්ලීම කිරීමට හැකියාවක් ඇත. (258 (2) කියවයි) පෙත්සම්කරුගේ සහ මෙම සමාගමේ සම්බන්ධතාවය පෙත්සමේ 5 වන ජේදයේ සවිස්තරව සදහන් වී ඇත. මෙම සමාගම 1983 මාර්තු මාසයේ පටන් ගන්නා ලද සමාගමකි. සමාගමේ ප්‍රාග්ධනය පෙත්සමේ 2, 3, 4, වගන්ති වලින් සදහන් වී ඇත. පෙත්සමේ පී.4 ලෙස ලකුනු කරන ලේඛණයේ මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් 1990 වර්ෂයේදී මෙම සමාගම ඈවර කිරීමට තීරණයක් කල් වශයෙන් ගන්නා ලදි. ( පැ.4 කියවයි) මෙම පෙත්සම්කරු කොළඹ දිසා අධිකරණයේ 3155 විශේෂ දරන නඩුවේ එම සමාගමට එරෙහිව 1990 දී පියවර ගත් අතර, එම නඩුවේ මූලික වශයෙන් කරුණු මෙම පෙත්සමේ 6 වන ජේදයේ එම නඩුව සම්බන්ධයෙන් සදහන් කර ඇත. ඉන්පසුව පෙත්සමේ 7 වන පරිච්ජේදයේ සදහන් කර ඇති පරිදි සමථ පත් කිරීමක් සිදු වූ අතර, සමථය අනුව ඩොලර් මිලියන දෙසිය හතකට සහ ශ්‍රී ලංකා රුපියල් මිලියන දහදාස් දෙසීයක සමාන මුදලක් කපා හරින ලදි. පෙත්සමේ 8 වන ජේදයේ සදහන් පරිදි එකී සමථය අත්හිටුවීමක්

සිදු වූ අතර, ඒ මත නඩු කිහිපයක්ම විසඳීමෙන් අනතුරුව ඉන් සමහරක් දැනට ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් පවතී. පෙත්සමේ 9, 10, 11, 12, ඡේදයෙහි මේ පිළිබඳව සවිස්තරව විස්තර කර ඇත. පෙත්සමේ 13 වෙනි ඡේදයේ කොළඹ දිසා අධිකරණ 5095 එස්.පී.එල්. දරන නඩුව සහ ඉන් මතුවූ අතුරු ඉන්ජන්ෂන් තහනම පිළිබඳව සවිස්තරව විස්තර කර ඇත. පෙත්සමේ 13, 14, ඡේදවල ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සහ දෙන ලද සමථය පිළිබඳව විස්තර කර ඇත. පෙත්සමේ 15 වන ඡේදයේ සඳහන් පරිදි ප්‍රාග්ධනය පිළිබඳව විස්තරයක් දී ඇති අතර, එකතු වූ පාඩුව මිලියන හයදාස් තුන්සිය පන්ස් එකයි දශම පහක් (6,351.5 ) ඉන් සඳහන් කර ඇත. පෙත්සමේ 17 ඡේදය ප්‍රකාරව පෙත්සම්කරු මෙම සමාගමේ එවකට හිටපු සභාපති වශයෙන් මේ සමාගම ඈවර කරනවා විනා වෙනයම් විකල්පයක් නැති බවට සඳහන් කරන ලදි. ඒ පිළිබඳව පැ.12 ලෙස ලකුණු කොට ඇති ලේඛණයේ දක්වා ඇත. පෙත්සමේ 18, 19, පරිදි එකී සමාගමේ විනිමය ප්‍රාග්ධනය සහ සිදුවී ඇති පාඩුව සවිස්තරව පෙන්වා ඇත. පෙත්සමේ 20, 21, හි සඳහන් පරිදි මෙකී සමාගමේ මූල්‍යමය පරිපාලනය සහ මූල්‍යමය පාඩුව සවිස්තරව පෙන්වා දී ඇත. පෙත්සමේ 22 හි සඳහන් පරිදි එකී පාඩුව දිගින් දිගටම ගෙනයාම පිළිබඳව සඳහන් කර ඇති අතර, පෙත්සමේ 23 වෙනි වගන්තියේ සඳහන් කර ඇති පරිදි මෙම සමාගම ඈවර කිරීමට විනා අන් ප්‍රතිකර්මයක් නොමැති බව දන්වා සිටියි. මෙකී පෙත්සම සමාගම් රීතියේ අංක 7, යටතේ එකී පෙත්සම පිළිබඳව රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, රීති අංක 7, යටතේ මෙම දැන්වීම ඉංග්‍රීසි භාෂාවෙන් ඩේලි නිව්ස් පත්තරයේ පළ කිරීමට ඉල්ලා සිටින අතර, ඒ පිළිබඳව විමසීමට දිනයක් ඉල්ලා සිටින අතර, ඈවර කිරීම පිළිබඳව

නොතිසියක් පළ කිරීමට ඉල්ලා සිටින අතර, විමසීමට ප්‍රථම මෙකී පියවර ගත් බවට සනාථ කිරීමට දිනයක් ඉල්ලා සිටිමි.

නියෝගය.

පෙත්සමේ සඳහන් කරුණු සහ පෙත්සම්කරු විසින් ඉදිරිපත් කරන ලද කරුණු සලකා බැලීමෙන් පසුව ඉල්ලා ඇති පරිදි අදාල දැන්වීම්, පුවත්පත් සාධක, ගැසට් නිවේදන, සහ අදාල සමාගමට මෙම ඉල්ලීම සම්බන්ධයෙන් නොතිසි නිකුත් කර වාර්තා කැඳවන්න -: 2007.01.26.

විමසීම -: 2007 පෙබරවාරි 02.

අත් කලේ

(සිසිර.කේ.රත්නායක)

අති දිසා විනිසුරු කොළඹ.

ඉහතින් දැක්වෙනුයේ කොළඹ දිසා අධිකරන 217 සි.ඕ. දරන නඩුවේ 2006.11.23 වන දින සාක්ෂි සටහන්වල සම්පූර්ණ සත්‍ය පිටපතක් බවට මෙයින් සහතික කරමි.

යතුරුලියනය- ය A

සැසඳුවේ

A/21/783712

රෙජිස්ට්‍රාර් 2006/11/24